(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 13 දරන මාවතගම සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 ජූනි මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ජූනි මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **5.75** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

## 1999 අංක 13 දරන මාවතගම සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1999 ජුනි මස 04 වැනි දින.]

එල්. ඩී.–ඕ. 31/96

### මාවතගම සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"මාවතගම සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එහි පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායි ලෙස ක්‍රියාවේ යෙදවීම සඳහා මෙතෙක් කල් මාවතගම පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ කරුණු සහ පරමාර්ථ මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද එම පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

කෙටි නාමය.

**1**. මේ පනත 1999 අංක 13 දරන මාවතගම සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මාවතගම සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**2**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) මාවතගම සංවර්ධන පදනමෙහි දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් මතු සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) "මාවතගම සංවර්ධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථය.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. :–

(අ) දිළිඳු ජනතාවගේ ආර්ථික තත්වය වර්ධනය කිරීම ;

(ආ) දේශීය බවභෝග අංශයේ සහ අපනයන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ යෙදී සිටින ජනතාවට ඒ සඳහා ආධාර ලබාදීම සහ ඒ අංශවල නිෂ්පාදන ඵලදායිතාව වර්ධනය කිරීම ;

(ඇ) ඉඩම් සංවර්ධන සහ කෘෂිකාර්මික කටයුතු කළමනාකරණය කිරීම භාර ගැනීම ;

(ඈ) ග්‍රාමීය සුළු කර්මාන්ත සහ ස්වයං රැකියා ජනනය සඳහා ආධාර කිරීම හා අනුබල දීම ;

(ඉ) ආත්ම විශ්වාසය ඇති කර ගැනීමට දිළිඳු ජනතාවට ධෛර්ය දීම සහ පෙළඹවීම ;

(ඊ) දරිද්‍රතාවය පිටුදැක්මේ ජාතික වැඩපිළිවෙලක් වශයෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමෘද්ධි ව්‍යාපාරයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ක්‍රියාශීලිව දායක වීම ;

(උ) ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය පිළිබඳව ජනතාව උනන්දු කරවීම හා ඒ සම්බන්ධයෙන් උපදෙස් දීම ;

(ඌ) සමාජ සජීවීකරණ ව්‍යාපෘති තුළින් සෞඛ්‍ය හා පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීම හා සමාජ ශුභ සාධන කටයුතු සඳහා ආධාර දීම ;

(එ) පානීය ජල පහසුකම් ලබාදීමට මූල්‍ය ආධාර හා උපදෙස් දීම ;

(ඒ) ග්‍රාමීය අඩු ආදායම්ලාභී දිළිඳු ජනතාවට නිවාස අවශ්‍යතාවලට අදාළ කාරණා සම්බන්ධයෙන් උපදෙස් දීම සහ ආධාර සැපයීම ;

(ඔ) මත්පැන්, මත්ද්‍රව්‍ය හා දුම්පානයෙහි අනිෂ්ට විපාක පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ඒවාට ඇබ්බැහිවීම්වලින් ඔවුන් වලක්වා ගැනීම ;

(ඕ) දේශීය සංස්කෘතියේ මූලික හරයයන් ආරක්ෂා කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ක) යහපත් සමාජ ක්‍රමයක් ඇති කිරීම අරභයා ග්‍රාමීය සංස්කෘතික හරයයන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ;

(ග) ආගමික සිද්ධස්ථාන කේන්ද්‍රකොට ගත් සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ච) ආගමික හා ජාතික උත්සවවල දී දේශීය සංස්කෘතික අගයන් මතුකර දැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ජ) මෙතෙක් පිරිහීමට පාත්‍රව පැවති දේශීය සංස්කෘතික සාරධර්ම විවිධ වැඩ පිළිවෙළවල් මගින් වර්ධනය කිරීමට ධෛර්ය දීම ;

(ට) පෙර පාසැල් අධ්‍යාපනය නගා සිටුවීමට දායක වීම, අනුබල ලබාදීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඩ) විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය තුළට ගැනෙන රජයේ ප්‍රසිද්ධ විභාග සඳහා පෙනී සිටින සිසුන්ට සම්මන්ත්‍රණ හා සාකච්ඡා මගින් උදව් කිරීම ;

(ණ) පාසල් අධ්‍යාපනය නොලබන ළමුන් සඳහා සාක්ෂරතාවය දියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ත) අවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම ; සහ

(ද) පුස්තකාල සේවා පහසුකම් ඇති කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ, සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ ද ආධාර මුදල් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතුකිරීමේ ද ගිවිසුම්වලට අවතීර්ණ වීමේ ද සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ හිතකර කවර වුවද ආකාරයක සියලු ක්‍රියා, කරුණු හෝ දේ ඉටු කිරීමේ, සිදුකිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ සභාපතිවරයාගෙන්, උපසභාපතිවරයාගෙන්, ගරු ලේකම්වරයාගෙන්, ගරු භාණ්ඩාගාරිකවරයාගෙන් සහ සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට අනුකූලව සංස්ථාවේ විධායක කමිටුවේ සාමාජිකයන් අතුරෙන් තෝරා ගනු ලබන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ තත් කාලයේ වලංගුව බල පවත්නා රීතිවලට අනුකූලව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ සභාපතිවරයා සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා වන අතර, ඔහු සංස්ථාවේ සෑම රැස්වීමකම මුලසුන ගත යුතු ය.

(3) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ පදනමේ කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සංස්ථාව විසින්, එහි යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :–

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සහ විධායක කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය සහ කළමනාකරණ මණ්ඩලයේ හා විධායක කමිටුවේ සාමාජිකයන්ගේ නිල කාලය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ සහ විධායක කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී සහ ඒ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම්

පවත්වන ස්ථාන, වේලාව සහ ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, ඒවායේ න්‍යායපත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ එම රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ මුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම සහ ඒවා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ පරිද්දෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**7**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතුව තිබුණු සියළුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලුම ණය සහ දායක මුදල් හා සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථා විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**8**. මිලදී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය තිබෙන අතර, ඒ සියලු දේපළ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් යම් ආකාරයකට බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**9**. සංස්ථාවේ මුද්‍රාව, සභාපති සහ ගරු ලේකම් හෝ ගරු භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස, කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එසේ කරනු ලැබූ අත්සන් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10**. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාගත ආයතනයක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ ඇති නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.